# තනිකම

සයුරු රළ පීරා
හිරු ගමනක් ගොසින්
තනිවම

නිසල දිය පාරා
සඳ හඬන්නී
මැදියම

ශ්‍රියා කුමාරසිංහ

## අපේ කවි කිවිඳියන්ටයි..

ඔබ විසින් එවනු ලබන විශේෂිත කවි පබැඳුම්, යම් කිසි කාලයක් අරමුණු කොට ලියන ලද දෑ (උදා: වෙසක්, පොසොන්, නත්තනල් උත්සව ආදී) අදාළ මාසයට පෙර අපට ලැබෙන්නට සලස්වන මෙන් ඉල්ලා සිටිමු. බොහෝ විට සන්නස නිමා වීමෙන් පසුව, ඔබ ප්‍රමාදව එවන **ඉතා අගනා ඔබේ නිර්මාණ** පළ කිරීමට නොලැබීම ගැන අපි මහත් සේ කණගාටු වන අතර ඊළඟ කලාපයන්හි ඒවා පළ කිරීමේ දී එම නිර්මාණයන්හි නිසි වටිනාකම ද නැති වන්නේය. එබැවින් එවන් නිර්මාණ සෑම මසකට 01 දාට පෙර අපට ලැබෙන්නට සලස්වන්න.

-සංස්කාරිකා-

# පියවරුන්ගේ දිනය

කළුවර පහව යන
උදෑසනකට ඇස් ඇර
"තාත්තේ" කියා කීවද
මා, මා නෙතු නොඇරි
උදෑසන තාම මතකද?

සිසිරය ගලා එන
සීත රැයක අවදිව
තුරුළු වුණු සෙනෙහස
තාත්තාගේ උණුහුම
තාමත් නුඹට මතකද?

කතාන්දර වල එන
බියකරු චරිත පණ ගෙන
බිය ගෙනෙන සිහින වල මැදියම
"තාත්තේ" කියා ගෙන නැගිටින
ළමා විය තාම මතකද?

මේ සොහොන
පාළුවෙන් තෙතබරිතය
ඒ රාත්‍රිය සේම බියකරුය
නුඹලගෙ සිනා හඬ නෑසේය

පියවරුන්ගේ දිනයට
කොහේ හෝ ඉඳ අවුදින්
දන හොවා දිදුල ඉටිපන්දම
තවත් වසරකට සෑහේය.

**තුසිත් රවීන්ද්‍ර අබේනායක**

# රොනට නොඑන බඹරු

*රෝස මලේ නුඹ නාඩන්නේ*
*නුඹ පැතූ වන බඹරා*
*වෙනතක යයි පියඹා*
*කුමටද දුක්වන්නේ*

*නයන පිනන රුචින සපිරි රුසිරු*
*නිබඳ සුවඳ දසත විහිදි මියුරු*
*මලෙක විලස නුඹ සැදකි සරා සොඳුරු*
*කිමද රොනට නොම ඇදෙන කරුණ බඹරු*

*සොඳින සිරුර සුවඳ දියර නහවා*
*සිනිඳු සළුව කිඳුරු ලෙසින පොරවා*
*"බඹර තුඩග රස විඳින බඹරු" පතලා*
*කුමන පලද නුඹ මෙලෙස කඳුළු සළලා*

*නාඩන් රෝස මලේ*
*තුණු වන බඹරින්ද,*
*ගුමු ගුමු හඬ නංගා*
*වෙනතක ඇදෙන වෙලේ*

**රසික සූරියආරච්චි**



# මියුලැසියේ....

නැළවෙන නිතඹ සිඹිනා දිගු කෙස් වැටිය
පිළිවෙළකට ඇඳි කිරි සුදු රැළි ගවුම
කවුළුව තු ළින් දකිනා ඔබ රූ සිරිය
නෙත පිනවන දසුනකි ඔබ කුමරියෙ දින ඇරඹුමට

මියුලැසියේ ඔබ යනෙනා මග දෙපස
පෙළහර පාන්නට මෙන් හරි නිසොල්මනේ
බලා ඉන්න ගහ කොළ සේ සෙවන දෙන
දෙනවද අවසර ඔබ හට සදහට සෙවනක් දෙන්න..?

නිරහංකාර මුත් තරමක දඟකාර
නෙත් පිය සලා බලන බැල්ම කෝමළය
පොත් මිටියක් තුරුළු කරන් ඔබ යනවා දුටුවාම
එයින් පොතක් වෙන්නට ඇත්නම් යයි සිතෙයි මට

නළලත වැටී මුණට තව ලස්සන දුන්න
කෙස් රොද නිසල හිරු දැක බිය උනාවදෝ..?
පාසල ඇරෙන දහවල ගිනි මද්දහනේ
දාහය නිවන සුළඟ වෙලා එන්නම් සිසිලක් දෙන්න

**යසා හේනබර්ග්** - ජර්මනිය



# ඔබ මහා පවුරක්

තවමත් ලෙඩ ඇඳේ ඉඳගෙන මං මේ ලියන්නෙ මංගල කතාව උනත් මෙය කියවන ඔබටත් මින් ගන්න යමක් ඇති කියලා හිතනවා.

මීට අවුරුදු 16 කට විතර කලින් අපි එකම රැකියා ස්ථානයකදී හමුවුනේ පෙර භවයකදී අපි අතරේ තිබුනු බැඳීමක් නිසාම වෙන්න ඇති කියලා අදටත් මං හිතනවා. ඒ සංසාර බැඳීමට කිසිම කෙනෙකු ගෙන් බාදක, වැටකඩොළු නැතුව දෙමව්පිය ආශීර්වාදයත් අපට ලැබුණා. අපි තනපු කැදැල්ලට පුංචි පැටව් දෙන්නෙක් එකතු වෙලත් දැන් අවුරුදු ගානක් ගෙවිලා ගියා. පුංචි පුංචි මත ගැටුම්, හිත් රිදවීම් වගේම සතුට, සමාදානයත් එක්ක මේ ආපු ගමන් මගට ලොකු කුණාටුවක් හැමුවෙ දැන් අවුරුද්දකට විතර කලින්. මගෙ ශරීරය ඇතුළේ සිදුවෙමින් තිබුන රෝග කාරක තත්ත්වයක් නිසා පරීක්ෂණ ගොඩක අන්තිම වෛද්‍ය තීරණය වුණේ ඇඟ ඇතුලේ තියන කොටස් කීපයක් ඉවත් කරන්නම ඕනි කියන එකයි. දැනට මාසෙකට විතර කලින් රෝහලේ වෛද්‍යවරිය ඒ ගැන දැනුම් දීපු මොහොත මට දැනුත් මැවිලා පේනවා වගේ. දැන්ම තීරණයක් ගන්න බැරි බවත් තවත් වෛද්‍ය උපදෙස් ගන්න ඕනි බවත් ඔහු කිව්වේ වෙඩරු පිඩක් වගේ උනුවෙලා ඇද හැලෙන්න ලංවුන හිත මහ මෙරක් වගේ ශක්තිමත් කර ගන්න අසාර්ථක උත්සාහයක යෙදෙමිනුයි. නමුත් අන්තිමට වෛද්‍යවරුන්ගේ, පවුලේ මගේම සොයුරු සොයුරියන්ගේ, හිතවතුන්ගේ ඒකමතික තීරණයට අපිට හිස නමන්නට සිදුවුණා. ඒත් තරුණ වියේ ඉන්න බිරිඳකගෙන් ඉටුවෙන්න ඕනි යුතුකම්, වගකීම් මඟ ඇරලා නිකන්ම නිකන් රූපයක් විතරක් වෙන්න මගේ හිත මට ඉඩ දුන්නෙම නෑ. ඒත් හැම දේකටම වැඩිය මගේ ජීවිතේ ගැන විතරක්ම හිතුව ඔහුත් මේ තීරණයටම එකඟ වුණා. පවුලේ සොයුරු - සොයුරියන්ගේ ආශීර්වාද, සුභ පැතුම් මැද්දේ ශෛල්‍ය කර්මයට මුහුණ දෙන්න ගෙදරින් පිටවෙන දවසේ මගේ අතට පඬුරක් දීලා කවදාවත්ම නැති විදියට ඔහු බාරයක් වෙන බව දැක්කම මං හිතුවෙ මගෙ ජීවිතේ දෙවියන්ට, බුදුන්ට භාර දුන්නා කියලයි. හිත හදා ගෙන රෝහලට ගියාම ශෛල්‍ය වෛද්‍යවරිය කිව්ව තවත් කතාවකින් මගේ අවසානය ළඟයි කියලම මට හිතුනෙ. බොහොම කණගාටුවෙන් උනත් කියන්න තියෙන්නේ මගේ ශෛල්‍යකර්මයෙ තවත් බරපතල තත්ත්වයක් මතුවෙලා තියන බවත්, ඒක ජීවිතයට ලොකු බලපෑමක් කල හැකි බවත්, ඇය කිව්වේ මගේ හිතේ ඉතිරි වෙලා තිබුණ පුංචි බලාපොරොත්තුවත් සුනු විසුනු කරමිනුයි. ශෛල්‍යාගාරයට යන්න අන්තිම මොහොත වෙද්දී මරණයට සූදානම් කරපු වැරදිකරුවෙක් වගේ රෝහලින් දීපු ඇඳුම්, තොප්පි, සපත්තු දාගෙන මං හිටියේ දුක, කණගාටුව මහ බරක් වෙලා පපුවේ හිරකර ගෙන. ඒ අන්තිම විනාඩි ගණන ඇතුළෙදි මං ඔහුගෙන් කරපු එකම ඉල්ලීම වුනේ මං ජීවත් වුණත් නැතත් අපේ පුංචි පැටව් දෙන්නව පණවගේ රැකබලා ගන්න කියන එකයි.

මං කවමදාවත් බලාපොරොත්තු නොවුන දෙයක් ඔහුගෙන් මට අහන්න ලැබුනෙ හීනෙකින් වගේ. ''මං අද ඉඳන් මස්, මාළු, බිත්තර කන එක අත්අරිනවා. කවමදාවත් මං ඔයාට මාව අත්ඇරලා යන්න දෙන්නෙ නෑ. මං ඒ දේ ඔයා වෙනුවෙන්ම කරනවා. කොහොම හරි මං ඔයාගේ ජීවිතේ ගක ගන්නවා'' කියලා. ඒ කිව්ව දේවල් මට විශ්වාස කරන්නත් බැරි තරම් වුණා. මම මස්, බිත්තර නොකෑවත් හැම කෑම වේලකටම ඔහු වෙනුවෙන් මගේ අතින් ඒ දේවල් පිළියෙල වුණා. වැඩිපුර එළවළු, කොල ජාති නොකාපු ඔහුගේ ප්‍රියතම කෑම වුනේ මස්, බිත්තර. ඉතිං මේ වගේ තීරණයක් ගන්න ඔහුට කොහොම හිත හදා ගන්න පුළුවන් වුනාද කියලා මට හිතා ගන්නවත් බැරි වුණා. ඊට කලින් දවසේ අපි හිතවතෙකුගේ දානෙ ගෙදරකට සහභාගි වුණා. දානෙන් පස්සේ ආපු පිරිසට කෑම මේසේ පිළියෙල වෙද්දී වැඩි අවදානය යොමුවුණේ ඔහු වෙත. සාංගික දානෙට මස්, මාළු, බිත්තර නැති නිසා අද ඔහු බඩගින්නෙ ඉඳිවිද කියලා විහිලුවකුත් මතුවුණා ඔවුන් අතරේ. ඔහුගේ මේ ගතිය හිතවතුන් පවා හොඳට දැනගෙන හිටියේ. ගෙදර කෑම හදල තියෙද්දීත් ''මැක්ඩොනල්ස්, කේ.එෆ්.සී.' දැක්කහම පුංචි උන් වගේ ඒ කෑමටමයි වැඩිපුර හිත ඇදිලා ගියේ ඔහුගේ.

ශෛල්‍ය කර්මයට කලින් හිතට මහා බලයක් ශක්තියක් වගේ හැඟීමක් මගේ හිතට දැනෙන්න ගත්තේ ඔහු මට දීපු මහා බලයක් හිතට කා වැදුනු නිසායි මං හිතන්නේ. ශෛල්‍යාගාරය තෙක් මගේ පිටුපසින් කඳුළු වගුරවමින් ආපු සොයුරියටත් ඔහුටත් මං සමුදුන්නෙ හිතට දැනුනු පුදුම සැහැල්ලුවකිනුයි. මගෙ සිහිවියක්ඟද කරන වෛද්‍යවරිය කිව්වේ ශෛල්‍ය කර්මයකට හිනා වෙලා බය නැතුව යන පළමු කෙනා ඔබයි කියලා. නමුත් ඔබේ සැමියා ගැන නම් මට හරිම දුකයි. ඔහු හුඟක් බයෙන්, දුකෙන් ඉන්නෙ. ඔහු වෙනුවෙන් කරන්න පුලුවන් හැමදේම අපි ඔබ වෙනුවෙන් කරනවා කියලා. මගෙ ශෛල්‍ය වෛද්‍යවරිය පවා පෞද්ගලිකවම ශෛල්‍යකර්මයෙන් පස්සේ ඔහුට තොරතුරු දන්වන්න පොරොන්දු වුණා. කොහොම උනත් පැය ගාණනක දිගු නින්දකින් පස්සේ වෛද්‍ය විද්‍යාවේ ප්‍රාතිහාර්යයක් සිදුවෙලා තියන බව මං දැන ගත්තෙ. හාස්කමකින් වගේ මගේ ඇඟ ඇතුලේ ඉවත් කළ යුතුයි කියලා තිබුණු සමහර කොටස් ඉවත් නොකරම සාර්ථකව ශෛල්‍ය කර්මය නිමවෙලා තිබුණා. පසුව දැන ගත්තේ මුල ශෛල්‍ය කර්මයෙන් සති හයකට පස්සේ තවත් ශෛල්‍ය කර්මයකට මට මුහුණ දෙන්න ඉඩකඩ තිබුන බව. නමුත් ඒ අභාග්‍යයෙන් මං මිදිලා ඉන්නෙ කියලා දැන ගත්තම හිතට පුදුම සැනසීමක් දැනුනෙ.

මගෙ අසනීප තත්ත්වය වෙනුවෙන් මට ආශීර්වාද කරන්න මගේ සොයුරියෝ, සොයුරො, නෑ හිතවතුන්, ස්වාමීන් වහන්සේලා වගේම අන්‍යාගමික හිතවතුන් පවා බොධි පූජා, භාරහාර, සෙත් පැතිම් වගේම සත්‍යාක්‍රියා පව කර තිබුණා. ඇත්තෙන්ම කායිකවත් මානසිකවත් ජීවිතෙන් ඇද වැටෙද්දී ඒ වගේ දේවල් මොනතරම් හිතට සැනසීමක්, ශක්තියක් ගෙන එනවද කියලා අත්දැකීමෙන්ම මං දැන ගත්තා. අපි ගෙනා ආයුෂ ඉවර නම් ජීවිතේ අත්හරින්න වෙන බව සැබෑවක්. නමුත් ජීවිතයක් ජීවත් කරවන්න පිරිසිදු හිතකින් තවත් හිතකට හෘදයාන්ගවම කරන ප්‍රාර්ථනාවක් තුළ මහා බලයක් තියෙනවා. මනුෂය හිතක් දියුණු කරලා බුදු පසේ බුදු රහත් වෙනව වගේම හිතකින් හිතකට මහා බලයක් ශක්තියක් ලබා දෙන්නත් පුළුවන් කියලා මං අවබෝධ කර ගත්තා.

කෙමෙන් කෙමෙන් සුවපත් වෙන මං වෙනුවෙන් හැම කෙනෙක්ගෙම ලැබෙන ආදරය, කරුණාව, කෝටි ගණනක් වටිනවා මට. හිතේ තිබුණු විසඳගන්න බැරි ලොකුම ප්‍රශ්නය මං ඇහුව ඔහුගෙන් මං පුංචි සුවයක් ලබපු දවසෙම. ඇයි මං වෙනුවෙන් මේ වගේ බාරයක් වුනේ කියලා. ඔහු දුන්න පිළිතුර මනුෂ්‍යත්වය ඉක්මවා ගිය එකක්ද කියලා හිතුණා මට. ඔහු දුන්නෙ මෙන්න මේ වගේ පිළිතුරක්. මටත් හිතුනා හැමෝම වගේ ලේසියෙන් ඉෂ්ඨ කරන්න පුළුවන් විදියට සාංගික දානයක්, බෝධි පූජාවක්, පන්සලකට ආධාරයක් වගේ දෙයක් බාර වෙන්න. ඒත් මට ඕනි වුණේ ඔයා වෙනුවෙන් මට කරන්න අමාරුම දේ කරලා කැපකිරීමක් කරන්නයි. මස්, බිත්තර කියන්නෙ මං කන්න කැමතිම දේ. ඉතිං මං ඒක කැප කරනවා ඔයා වෙනුවෙන්. ඒක මගේ හිතට වගේම ඔයාගෙ හිතටත් ලොකු ශක්තියක් වෙයි කියලා මං හිතුවා.

වෙනද වගේම දරුවන් වෙනුවෙන් මස්, මාළු, බිත්තර සුවඳ දිදී ඉදෙද්දී එළවළුවක්, සලාදයක් එක්ක බත්කන ඔහුව දකිද්දි මට ඇති වෙන හැඟීම මටම තේරුම් ගන්න බෑ. ඒක දුකක්ද? ආදරයක්ද? භක්තියක්ද කියල තවත් මං හිතනවා. ඒ කැප කිරීම මං වෙනුවෙන් කළේ දවසකටද? මාසෙකටද? අවුරුද්දකටද? ජීවිත කාලයටමද? කියන එක මට ප්‍රශ්නයක් නෙමේ. එකම වේලක් හරි ඒ අත්හැරීම කළේ මං වෙනුවෙන්. මට වටින්නේ ඒ කැපවීම විතරමයි.

පවුල් ජීවිතයක් ගෙනියද්දි අපි කොයි කා අතරත් ප්‍රශ්න, කරදර, හිත් රිදීම් මත ගැටුම් ඇති වෙන්න පුළුවන්. ඒත් ඒ එක්කම අපි එකිනෙකා කෙරෙහි තියන ආදරය, බැඳිම, විශ්වාසය, පළුදු කර නොගෙන අපිට බැඳීමෙන් ඉන්න පුළුවන් නම් ඒකම මහා පවුරක් වේවි අපිවම සුරකින.

